ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2394/34 – 2024 ජූලි 23 වැනි අඟහරුවාදා – 2024.07.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2021/166.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2023.10.30 දිනැති හා අංක 2356/05 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2023.10.18 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් ලබ්බල, කු/ලබ්බල, කන්දෙවත්ත, අංක 425 හි පදිංචි එච්. එම්. එන්. ජී. එම්. පී. හේරත් මිය ඇතුළු සේවකයින් දස දෙනෙක් සහ අනෙක් පාර්ශ්වය වශයෙන් පැලියගොඩ, මීගමු පාර, තේමා උද්‍යාන ගොඩනැගිල්ල හි පිහිටි ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය (ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධ ආයතනයකි.) අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A66/2023 හා 2024.05.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේදීය**

යොමු අංකය - IR/COM/02/2021/166
නඩු අංකය - A/66/2023

*පළමු පාර්ශ්වය*

එච්. එම්. එන්. ජී. එම්. පී. හේරත් මිය ඇතුළු සේවකයින් දස දෙනෙක්
(ග්‍රේෂන් ද සිල්වා මහතා පෙනී සිටි)
නො. 425, කන්දෙවත්ත, කු/ලබ්බල, ලබ්බල

*පැමිණිලිකාර පළමු පාර්ශ්වය*

*එදිරිව*

*දෙවන පාර්ශ්වය*

ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය,
(ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධිත ආයතනයකි)
තේමා උද්‍යාන ගොඩනැගිල්ල,
මීගමු පාර,
පැලියගොඩ.

පරිපාලන නිලධාරී ආර්. එස්. පී. ජයදාස සමග
නීති නිලධාරී සර්ධා පොන්සේකා සහ නීතිඥ
සෙනුරි ගුණතිලක පෙනී සිටින ලදී.

**ප්‍රදානය**

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය අනුව ඔහු වෙත පැවරී ඇති බලතල අනුව උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා 2023.10.18 දිනැති නියෝගයේ බේරුම්කරුවකු වශයෙන් මා පත් කොට මා වෙත යොමු කර ඇත.

**ආරාවුලට හේතු වී ඇති කරුණු**

ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට අනුබද්ධ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවය කළ එච්. එම්. එන්. ජී. එම්. පී. හේරත් මිය සහ පහත නම් සඳහන් නවදෙනාගේම සේවය අවසන් කිරීම මගින් ඔවුන්ට සිදු වී ඇති අසාධාරණයයි.

1. ඩබ්ලිව්. ජේ. ඒ. ජී. උදේශිකා මිය
2. ඩබ්ලිව්. එම්. පුෂ්පා කුමාරි වනිගසේකර මිය
3. ඒ. එම්. සුගත් බණ්ඩාර මයා
4. ඒ. එච්. සඳනිකා මිය
5. ඩබ්ලිව්. ජී. ඒ. මධුමාල් මයා
6. එම්. ඩී. අජිත් පුෂ්පකුමාර මයා
7. බී. පී, රුවන් මයා
8. බී. පී. ඩී. කුමාර මයා
9. ජේ. එම්. නාලක ජයසිංහ මයා

2020.04.29 දිනැති N/HR/N/APP/ 370 අංක දරන ලිපියෙන් දන්වා සිටින ලද්දේ 2020.05.31 වැනි දින සිට සේවය අවසන් කිරීමට සියලු ඉල්ලුම්කරුවන් දස දෙනාටම දන්වන ලදි.

**පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය**

මෙම පරීක්ෂණය 2023.12.07 දිනට මුල්වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ කාලය තුළ සෑම දිනකම දෙපක්ෂයම පෙනී සිටින ලදි.

**ඉල්ලුම්කරුවන් වෙනුවෙන් පෙනී සිටින නියෝජිත මෙසේ ප්‍රකාශ කර සිටී.**

1. ඉල්ලුම්කරුවන් දස දෙනා දන්වා සිටින්නේ ඔවුන්ව අසාධාරණ ලෙස සේවය නතර කරන ලද බැවින් නැවතත් සේවයේ පිහිටුවන ලෙසය.

2. පළමු පාර්ශ්වයේ සාක්ෂිකරු කියා සිටින්නේ මැතිවරණ කොමසාරිස්ගේ ලිපියෙන් දන්වා සිටින්නේ නව පත්වීම නතර කරන ලෙසටය.

3. කෙසේ නමුත් නව පත්වීම් නතර කොට පළමු පත්වීමේ සේවය නතර කිරීම ය.

**නිරීක්ෂණ**

1. මේ සඳහා මැතිවරණ කොමසාරිස් ආයතනයට පැමිණ සාකච්ඡා කර වාර්තාවක් එවන ලෙසට දන්වා සිටින ලදි. නමුත් දෙවන පාර්ශ්වයේ සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ එම වාර්තාව මැතිවරණ කොමසාරිස්ට නොයැවූ බවයි.

2. ඉදිරිපත් කිරීමට දැන්වූ ලේඛන අංක R 10 තුන් වතාවක් පොරොන්දු වූ පරිදි ඉදිරිපත් කර නැත. මෙයින් පෙනී යන්නේ එම ලිපියෙන් දෙවන පාර්ශ්වයට අගතියක් වන බැවින් එම ලේඛනය ඉදිරිපත් නොකිරීමයි.

3. 2024.02.19 දි පළමු පාර්ශ්වයෙන් ඉදිරිපත් කරන ලද මෝසමෙන් ඉල්ලා සිටි ලේඛන 2024.03.15 ලබාදීමට පොරොන්දු විය. එහි ඉල්ලා සිටි පළමු ලේඛනය හැර

4. ඉල්ලා සිටි ලේඛන අංක 2 සිට 6 දක්වා සොයා ගැනීමට නොහැකි වූ බවත් ප්‍රධාන කාර්යාලය කීප අවස්ථාවකදීම ගොඩනැගිලි කීපයකටම ගෙන ගිය බැවින් මෙය සොයා ගැනීමට දුෂ්කර වූ බව කියා සිටින ලදි. මෙවැනි ආයතනයක මෙවැනි සිදුවීමක් සිදු වූ බවට විශ්වාස කළ නොහැක.

5. තවද R 11 යටතේ ඉදිරිපත් කරන DMS/POLICY/recruitment දරන 2019.11.20 දිනැති ලිපියෙන් සඳහන් පරිදි සියලු බඳවා ගැනීම් අත්හිටුවීමටය.

6. මැතිවරණ කොමසාරිස්ගේ අංක EC/EDR/PRE/INQ අංක දරන 2019.9.30 දිනැති ලීපිය හා නිවාස ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ අංක දරන 01/01/2019election2019/10/01දින ලිපිය සැලකිල්ලට ගෙන නොතිබේ.

7. ඒ අනුව ඉල්ලුම්කරුවන්ගේ සේවය නතර කරන ලෙස දන්වා නොමැත.

ඉල්ලුම්කරුවන් දසදෙනාට ඔවුන් අන්තිම වරට ලබා ගත් මාසික වැටුපේ (ඇමුණුම් 1- 10 දක්වා අනුව) තබා ගෙවීමටත් ඔවුන්ට හිමි සේවා අර්ථ සාධකය සහ සේවා භාරකාර මුදල ද ගෙවිය යුතුය.

තවද පරීක්ෂණය අවසානයේ පෙනී යන්නේ ඉල්ලුම්කරුවන්ට හිමි වැටුපෙහි පිහිටුවා නැවත සේවය ලබා දීමය.

**ප්‍රදානය**

ඉල්ලුම්කරුවන් දසදෙනා විසින් ඉල්ලා ඇති නැවත රැකියා ලබා දී සේවයේ පිහිටුවීමට නියෝග කරමි.

01. මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට මසක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට හිමි හිඟ වැටුප් හා අනිකුත් දීමනා සේවය නතර කළ දිනයේ සිට නැවත සේවයේ පිහිටුවන දින දක්වා ගණනය කර ගෙවීම සිදුකර ඒ බව උතුර කොළඹ සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කළ යුතු බවට නියම කරමි.

02. ඉදිරිපත් කරන ලද DMS/ POLICY/recruitment ලිපියෙහි සඳහන් කර ඇත්තේ නව පත්වීම් තාවකාලිකව අත්හිටුවන ලෙසයි.

03. මේ හා සම්බන්ධයෙන් සේවය නතර කරන ලද අනිත් සේවකයින් වෙනුවෙන් අතුරු නියෝගයක් ශ්‍රේෂ්ඨාධිකරණයෙන් අංක දරන SCSRA298/2020 නියෝගයෙන් නැවත සේවයේ පිහිටුවන ලෙසට දී ඇති නියෝගය ද සැලකිල්ලට ගෙන ඉල්ලුම්කරුවන් දසදෙනා ඉල්ලා සිටින නැවත රැකියාවේ පිහිටුවීම කරන ලෙස නියෝග කරමි. තවද ශ්‍රේෂ්ඨාධිකරණයේ අතුරු නියෝගය SCSRA298/2020 මේ සම්බන්ධයෙන් සැලකිල්ලට ගත යුතුය.

04. ව්‍යවස්ථාපිත හිමිකම් ලබා ගැනීම සඳහා මෙම ප්‍රදානය බාධාවක් නොවන බව සැලකිය යුතුයි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත බවට ප්‍රකාශ කරමි.

කපිතාන් **M.G.G.** මෙන්ඩිස්,
බේරුම්කරු.

2024 මැයි මස 17 වැනි දින කාර්මික අධිකරණයේ දී ය.

EOG 07- 0228

---

මගේ අංකය: IR/COM/03/2016/183.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2019.03.28 දිනැති හා අංක 2116/57 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.03.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පන්නිපිටිය, ඇරැව්වල, සුහද මාවත, අංක 179/6 ඒ (වර්තමාන ලිපිනය: බුලත්සිංහල, බෝතලේගම, පැල්පොල වත්ත, අංක 137) හි පදිංචි එච්. ඒ. උදේනි පුෂ්පකාන්ති මිය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A30/2019 හා 2024.05.30 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ජූලි මස 10 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණය.

නඩු අංකය - ඒ/30/2019
IR/COM/03/2016/183

එච්. ඒ. උදේනි පුෂ්ප කාන්ති මිය,
අංක 179/6 ඒ,
සුහද මාවත, ඇරැව්වල,
පන්නිපිටිය.

*ඉල්ලුම්කාර පාර්ශ්වය*

සහ

ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය,
අංක 200, කිරුල පාර,
කොළඹ 05.

## ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 සහ 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව පහත දැක්වෙන ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා මා පත් කොට මා වෙත පවරා ඇත.

එකී යොමු කිරීම පාර්ශ්වකරුවන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී ඇත්තේ,

'' ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයේ කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ අභ්‍යන්තර ගිණුම් අංශයේ සේවය කළ එච්. ඒ. උදේනි පුෂ්ප කාන්ති මිය, සිය සේවායෝජක විසින් 2013.03.14 වන දින සිට සේවය අතහැර ගිය අයකු සේ සලකා කටයුතු කිරීම යුක්ති සහගත ද? එසේ නොවේ නම් ඇයට ලැබිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ''.

දෙපාර්ශ්වය විසින් අදාළ විස්තර ප්‍රකාශ ගොනු කළ පසු 2019.11.20 වන දින සහ 2020.01.28 යන දිනයන් හිදී විභාගයට ගැනීමට පෙර දෙවන පාර්ශ්වය 2019.11.07 වන දින ඉදිරිපත් කරන ලද විරෝධතාවය පිළිබඳව දෙපාර්ශ්වයේම ලිඛිත දේශනවල කරුණු අනුව මෙම පරීක්ෂණය ඉදිරියට ගෙනයාමකින් තොරව අවසාන තීන්දුවක් ගැනීමට නොහැකි බව පෙනී ගියෙන් 2020.02.26 දින විභාගයට නියම කළත් පැමිණිලිකාර පාර්ශ්වය දිවුරුම් ප්‍රකාශ මගින් මූලික සාක්ෂිය ඉදිරිපත් කිරීමට එකඟවීම නිසා 2020.02.26 දින විභාගයට නියම කළත් රටේ පවතින අයහපත් සෞඛ්‍ය තත්වය මත 2020.09.02 දින පළමු පාර්ශ්වය ඉදිරිපත් කළ මූලික සාක්ෂි සහිත දිවුරුම් ප්‍රකාශය අනුව හරස් ප්‍රශ්න ඇසීම 2021.03.03 ආරම්භ කරන ලදි. ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් ශ්‍රේෂන් සිල්වා මහතා ද දෙවන පාර්ශවය වෙනුවෙන් රජයේ නීතිඥ පියුමි ජයවික්‍රම මෙනවිය ද පෙනී සිටින ලදි. 2022.07.04 දින සිට දෙවන පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතිඥ දිල්හානි රත්නායක මෙනවිය ද 2022.09.07 දින සිට පළමු පාර්ශ්වය වෙනුවෙන් එච්. ඒ. ජී. මයිකල් මහතා ද පෙනී සිටින ලදි.

පළමු පාර්ශවකාරිය IX - ශ්‍රේණියේ ( 9 වන ශ්‍රේණියේ) ලිපිකාරිනියකව සිට VIII - ශ්‍රේණියේ ගිණුම් ලිපිකාරිනියක ලෙස සේවය කරමින් සිටියදී 2012.01.02 දින උඩුහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයේ හදිසි විගණනයක යෙදී සිටිය දී කලක් රියදුරු අභ්‍යාස විද්‍යාලයේ සේවය කර ඇති නිලධාරිනියක් වන බී කාන්ති රත්නායක යන අය රාජකාරියට බාධා කරමින් පරුෂ වචනයෙන් බැන වැදීම නිසා සේවා ප්‍රධානියා හරහා ඉහළ කළමනාකාරිත්වයට දැනුවත් කර ඇත. බී. කාන්තිරත්න යන අය නැවතත් රියදුරු අභ්‍යාස විද්‍යාලයේ ශිෂ්‍යයන් ඉදිරියේ පරුෂ වචනයෙන් බැන වැදී තර්ජනය කිරීම නිසා ඉල්ලුම්කාරිය තම ආරක්ෂාව පිණිස එම විදුහලේ ලොග් සටහන් පොතේ සටහනක් තබා මිරිහාන පොලීසියට පැමිණිලි කළ බවත් (CIB - 01-28168) දිවුරුම් ප්‍රකාශයෙන් ප්‍රකාශ කර ඇත.

එම පොලිස් පැමිණිල්ල අනුව බී. කාන්තිරත්න මහත්මියට පොලීසියේදී තරයේ අවවාද කරන ලද බවත් එම පරීක්ෂණයට පොලීසියට යෑම පිළිබඳව රාජකාරි නිවාඩු අනුමත නොකළ බවත් (ඒ - 5 ලිපිය) එම සිද්ධිය පිළිබඳව දෙවන පාර්ශ්වය බී. කාන්තිරත්න මහත්මියට එරෙහිව විනයක්‍රියා මාර්ග ගැනීමට මැලිකමක් දක්වන ලද බවත් එම විදුහලේ කලක් සේවය කර තිබූ බී. කාන්තිරත්න මහත්මිය 2012.01.06 වන දින අනාවරණ වූ විෂමතා සම්බන්ධව ක්‍රියාකිරීමට බාධා පමුණුවන ලද බවත් එතැන් සිට තම රැකියාව කිරීමට අපහසු වන අයුරින් විවිධ හිරිහැර බාධක ඇති කරන ලද බවත් තමාගේ වේතන නිවැරදි කර නැති නිසා 2001.11.22 දින සිට VIII B ශ්‍රේණියේ පිහිටුවා අදාළ වැටුප් තලවල තැබීමට ප්‍රධාන ගිණුම් පරීක්ෂක විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පාලන) වෙත ලිඛිතව දන්වා ඇතත් (ඒ - 6) ප්‍රධාන මානව සම්පත් කළමනාකරණ ලාල් පීරිස් මහතා හිතාමතා එම ගෙවීම් ප්‍රමාද කර ඇත. එම නිසා VI ශ්‍රේණියට අයදුම් කිරීමට සුදුසුකම් තිබුණත් නොහැකි වූ බවත් එම ලේඛන (ඒ - 7, ඒ- 8, ඒ- 9) වශයෙන් ලකුණු කරන ලදි.

ඉල්ලුම්කාරියගේ රාජකාරී ස්වභාවය අනුව සේවා ස්ථානයෙන් බැහැරව (ස්ථාන 12ක) සේවය කිරීමට සිදු වීම මත '' ඇයගේ ස්වාමිපුරුෂයාගේ මානසික තත්වය හා හැසිරීම පිළිබඳව දන්නා අයෙකු ඇය පිළිබඳව ඔහුට සාවද්‍ය තොරතුරු සැපයීම හේතු කොට ඔහු හා ඇය අතර අඩදබර ඇති වූ බවත් 2012.05.14 දින 12.00 පැයට ආසන්නව මට්ටක්කුලිය ඩිපෝවේ රාජකාරී කටයුතු කරද්දී කිසිදු හේතුවක් නොමැතිව ඇයගේ ස්වාමිපුරුෂයා පැමිණ ඉල්ලුම්කාරිය වන ඇය හට පහර දුන් බවත් එම අවස්ථාවේ පොලීසිය ගෙන්වා අවශ්‍ය පියවර ආරක්ෂක අංශ ගත් බවත් එම ස්ථානයේ ලොග් සටහනේ සටහන් තැබූ බවත් කියා ඇත. මේ බව දැනගත් කොළඹ ප්‍රධාන ප්‍රාදේශීය කළමනාකාර වික්‍රමසිංහ මහතා ඇයගේ ආරක්ෂාව සඳහා සේවා ස්ථානයෙන් බැහැරව සේවයේ නොයෙදෙන ලෙසත් ඒ පිළිබඳව ප්‍රාදේශීය අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක වෙත ද උපදෙස් දී තිබුණත් එය නොතකා සේවා ස්ථානයෙන් බැහැරව සේවයේ යොදවන ලද බවත් ඒ අතරතුර ඇයගේ සේවා ස්ථානයේ කවුරු හෝ ඇයගේ ස්වාමිපුරුෂයා කෝපගන්වා ඇයගේ පවුල් දිවිය ද අවුල් කර ඇති බවත් ඒ පිළිබඳව මහරගම පොලීසියට පැමිණිලි කළ බවත් 2012.01.06 දිනැති (ඒ -4) සැලකිල්ලට නොගෙන 2013.01.02 දිනැතිව චෝදනා පත්‍රයක් නිකුත් කොට ඇති බවත් එම චෝදනා පත්‍රයට නිදහසට කරුණු දැක්වීමට කොට්ඨාස ප්‍රධානියා මගින් ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ඉල්ලා සිටිය ද ඒ සඳහා අවස්ථාව ලබා නොදී විනය පරීක්ෂණය ආරම්භ කළ බවත් ( ඒ - 11 සිට ඒ- 13) 2013.03.11 දිනට කල් තැබූ විනය පරීක්ෂණය ඉන් පසු ඇය හට නොදන්වා පවත්වා ඇත. සේවයට පැමිණීමට ඇති බාධක පිළිබඳ දුරකථනයෙන් ප්‍රාදේශීය අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක වෙත දන්වන විටත් ස්වාමිපුරුෂයා සේවා ස්ථානයේ සිටින බව ස්ථානභාර නිලධාරිනිය දන්වන ලද බවත් ඒ බව ඇය වෙත දැන්නුවත් පොලිස් ස්ථානයට දැනුම් නොදී ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක වෙත දුරකථනයෙන් දන්වා ඇති බව දැන ගැනීමට ලැබුණ බව සාක්ෂි දී ඇත.

ආරක්ෂාව සහිතව සේවා ස්ථානයට පැමිණ සොයා බැලීමේදී 2013.03.14 වන දින සිට ඇයට සේවය අතහැර ගිය අයෙකු ලෙස ලිපියකින් දන්වා ඇති බව දැන ගැනීමට ලැබූ බවත් (ඒ - 15) එකී ලිපියට අනුව ප්‍රධාන මානව සම්පත් කළමනාකාරවරයාට පිටපතක් සහිතව අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක වෙත පිළිතුරු සපයමින් '' සේවයට වාර්තා කිරීමට ඇති අපහසුතාවය මත මේ පිළිබඳව ඉහළ කළමනාකාරිත්වය වෙත යොමු කර නව සේවා ස්ථානයක් හෝ ඒ පිළිබඳව විකල්ප ක්‍රියා මාර්ගයක් මා වෙත ලබා දෙන තෙක් සේවයට වාර්තා කිරීමට අපහසු බවත් ඒ සඳහා අනුමත පඩි රහිත නිවාඩු ලබා දෙන ලෙස'' (ඒ -16) ඉල්ලා ඇති බවද එම ලිපියට ස්ථාන භාර නිලධාරිණිය සහ ප්‍රධාන මානව සම්පත් කළමනාකරු ලාල් පීරිස් පිළිතුරු සැපයීමක් සිදු නොකළ අතර ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක තම පිළිතුරු ලිපියෙන් '' සේවයට වාර්තා කිරීමෙන් පසු ස්ථාන මාරු වීම් හෝ ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ හැකි බව'' (ඒ - 17) දන්වා ඇත.

සේවයට වාර්තා කිරීමට 2013.04.22 දින 8.30 පැයට සේවා ස්ථානයට ගිය ද ස්ථාන භාර නිලධාරිනිය එයට ඉඩ නොදී කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රධාන පරිපාලන නිලධාරිනිය ලඟට යවා ඇත. පරිපාලන නිලධාරිනිය නොපැමිණි දින සඳහා වෛද්‍ය සහතික නොමැති නම් සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා දිය නොහැකි බව දන්වා සිටීම නිසා පිටකොටුව පොලීසියට පැමිණිල්ලක් ඉදිරිපත් කළ බවත් (ඒ- 18 ) එදිනම ප්‍රධාන අභ්‍යන්තර ගිණුම් පරීක්ෂක තැනට සහ ප්‍රධාන මානව සම්පත් කළමනාකරුට ද පිටපත් සහිතව ස්ථාන භාර නිලධාරිනියට ලේඛනගත තැපෑලෙන් දැන්වූ බව (ඒ- 19) ට අනුව පිළිතුරු නොමැති බැවින් ලංගම විනය ව්‍යවස්ථාවේ 21.2 ට අනුව ඉහත කී නිලධාරීන් වෙත නැවත සේවයට වාර්තා කිරීමට නොහැකි වූ කරුණු දක්වමින් නැවත සේවය පුනපත් කොට වෙනත් සේවා ස්ථානයකට මාරු කර දෙන ලෙස ඉල්ලා සිටිමින් 2013.05.20 දින අභියාචනයක් ලේඛන ගත තැපෑලෙන් (ඒ- 21) ඉදිරිපත් කර ඇත. ඉන් පසු 2013.10.30, 2014.03.26, 2014.10.15 දිනට ලද මුල් අභියාචනය සිහිපත් කර ලිපි කිහිපයක් සහකාර මානව සම්පත් කළමනාකරු මගින් ඉදිරිපත් කරන ලද බව කියා ඇත. ඒ - 23 සිට ඒ -25 දක්වා ලේඛන ඉදිරිපත් කර ඇත. ප්‍රධාන මානව සම්පත් කළමනාකාර ලාල් පීරිස් මහතා ඉල්ලුම්කාරිය නැවත සේවයේ ප්‍රතිස්ථාපනය කිරීම මගහරින බව දැනගත් පසු 2015.03.11 වන දින වගඋත්තරකාර මණ්ඩලයේ ප්‍රධානි පී. ඩී. බාලසූරිය මහතා වෙත අභියාචනයක් ( විනය ව්‍යවස්ථා මාලාවේ 17 යටතේ) කළ බවත් (ඒ- 26) ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති වෙත යොමු කළ (ඒ-29) ලිපියට

ක්‍රියාමාර්ගයක් නොගැනීම නිසා 2016.06.15 දින වගඋත්තරකාර මණ්ඩලයේ සභාපති වෙත කරුණු දන්වා ඇති බව(ඒ- 30, ඒ- 30(ඒ), ඒ- 30(බී) ලේඛන) කියා සිටී. නැවත වගඋත්තරකාර මණ්ඩලයේ සභාපති වෙත 2016.07.08 දින සිහිකැඳවීමේ ලිපියක් (ඒ - 31, ඒ - 31(බී)) යවා ඇත. ඇයගේ දිවුරුම් පිට සාක්ෂි දීම මගින් '' අයුක්ති සහගත සහ අසාධාරණ මෙන්ම නිර්මාණශීලී ලෙස සේවය අහෝසි කිරීම සම්බන්ධව විනය ව්‍යවස්ථාවට අනුකූලව ඉදිරිපත් කළ අභියාචනා නොසලකා හැර වසර 10 කට වඩා සේවය අත්හිටුවා හෝ අහිමිකර තිබූ සේවකයින්ට නැවත රැකියාව ස්ථාපනය කළත් ප්‍රධාන මානව සම්පත් කළමනාකාර ලාල් පීරිස් මහතා හිතමතාම ඉල්ලුම්කාරියගේ රැකියාව ප්‍රතිස්ථාපනය කිරීම වැලැක්වූ බව කියා ඇත.

ඉල්ලුම්කාරියගෙන් වගඋත්තකාර පාර්ශ්වයේ නීතිඥවරිය හරස් ප්‍රශ්න අසමින් ඒ - 34 දක්වා ලේඛන අදාළ කර ගන්නේ ද අසන ලදි. එම ලේඛන අදාළ කර ගන්නවා යැයි උත්තර දුන් පසු විත්තියේ නීතිඥවරිය කියා සිටියේ විසඳිය යුතු ප්‍රශ්නයට අදාළ නොවන නිසා ඒවා අදාළ කර නොගන්නා ලෙසය. එමෙන්ම නීතිඥවරිය කියා සිටින්නේ සාක්ෂි ආඥපනතේ 5 වන වගන්තියට අනුව විසඳිය යුතු ප්‍රශ්නයට අදාල නොවන කරුණු සම්බන්ධව සාක්ෂි මෙහෙය වීමේ හැකියාවක් නොමැති බවයි. 1950 අංක 43 දරන පනතේ 35 වන වගන්තියේ 4 වන උපවගන්තියට අනුව එම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට තීරණය කරන ලදි. රජයේ නීතිඥවරිය විසින් දිගින් දිගටම සේවය හැරගිය බව තහවුරු කිරීමට හා නිවාඩු අනුමත කර නොගැනීම, වාර්ෂිකව නිවාඩු ගැනීම ආදිය පිළිබඳව හරස් ප්‍රශ්න ඇසුවත් පඩි රහිත නිවාඩු යාමක්, වාර්ෂික නිවාඩු අවසන් වීමක් ගැන ප්‍රශ්න කර හෝ ඔප්පු කර නැත. යම් අයෙකුට වාර්ෂිකව හිමි නිවාඩු වර්ෂය තුළ තම අවශ්‍යතාවය මත ගැනීමේ හැකියාව තිබේ. එය යම්කිසි සීමාවක් තුළ ලබා ගත හැකිය.

ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් කැඳවූ අවුරුදු 14 ක සේවා කාලයක් සහිත පුද්ගලයෙකු වන සහකාර මානව සම්පත් සහකාර කළමණාකරු ටී. ජී. උමේෂ් සංජීවගේ මූලික සාක්ෂි මගින් ඉදිරිපත් කළේ නොදන්වා සේවයට නොපැමිණීමට ගත යුතු ක්‍රියාමාර්ගය පිළිබඳව 21 වගන්තියෙන් දක්වා තිබෙන බවත් 21.2 අනුව අභියාචනයක් මසක් තුළ කළ හැකි බවත් ය. 2013 සිට 2015 දක්වා කාලය තුළ රැකියා අහිමි වූ 900 කට වැඩි පිරිසක් නැවත සේවයට ප්‍රතිෂ්ඨාපනය කර තිබෙනවා නේද? කියා ඇසූ ප්‍රශ්ණයට පිළිතුරු දෙමින් එම කාල සීමාව තුළ කමිටුව මගින් සලකා බලා තියෙනවා. ප්‍රවාහන අමාත්‍යංශයේ සහකාර ලේකම් ඉල්ලුම්කාරිය පිළිබඳව විස්තර 2015.10.20 වන දින ( ඒ - 29) ලිපියේ සඳහන් කරුණු ඉල්ලා ඇති බව පවසන ලදි. ඒ -20 ඉල්ලුම්කාරියට යොමු කර ඇති බවත් එම නිසා 2013.05.20 අභියාචනයක් කර ඇති බව ඒ- 20 පෙන්වා ඇසූ විට එය පිටපතක් නිසා පිළිගත නොහැකි යැයි කියා සිටී. ප්‍රධාන මානව සම්පත් කළමනාකරු වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණි සාක්ෂිකරුගෙන් ඉල්ලුම්කාරියගේ නියෝජිතයා ආරම්භයේදීම අසන ලද දෙවන ප්‍රශ්නය වූයේ '' තමා සාක්ෂි දෙන්න පැමිණියේ කවුරුන් වෙනුවෙන් ද?'' යන්නයි. ඒ සඳහා පිළිතුර වූයේ '' ආයතනය (දෙවන පාර්ශ්වය) වෙනුවෙන් '' යැයි පිළිතුරු දී ඇත. දැනටත් සහකාර මානව සම්පත් කළමනාකරු ලෙස සේවය කරන බවටත් සාක්ෂි දී ඇත.

අවුරුදු පහට වැඩි ලේඛන අපහරණය කරන බව කීවත් ඉල්ලුම්කාරියගේ සේවය අතහැර ගියා සේ සැලකූ දිනයත් ඒ - 29 ය ලිපියේ දිනයත් බැලුවිට අවුරුදු පහ ඉක්මවා නැහැ නේද? යනුවෙන් ප්‍රශ්න කළ විට ඒ සඳහා පිළිතුර වූයේ නැත" යනුවෙනි. 2016.06.15 දින දරන සභාපතිවරයාට ලියාපදිංචි තැපෑලෙන් යවා ඇති ඒ - 30 දරන රිසිට් පත සහිත ලිපිය පෙන්වා එය සභාපතිවරයාට යවන ලද ලිපියක් දැයි ඇසූ විට පිළිතුර ලෙස ඔව් යැයි පවසා ඇත. ප්‍රධාන මානව සම්පත් කළමනාකරු භාරයේ ඉහත ලේඛනවල මුල් පිටපත් තිබිය යුතු නේදැයි කියා ඇසූ විට පිළිතුර වූයේ '' ඒ පිටපත් සොයා ගැනීමට නොහැකි නිසා ඒක කියන්න අපහසුයි " කියා පිළිතුරු දී ඇත. ප්‍රශ්නය සහකාර මානව සම්පත් කළමණාකරු සාක්ෂි දීමට පැමිණ සිටියේ ප්‍රධාන මානව සම්පත් කළමනාකරු ලාල් පිරිස් වෙනුවටය. ලාල් පිරිස් යන අය ප්‍රධාන මානව සම්පත් කළමණාකරු වීමට පෙර උඩහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයේ විදුහල්පති කීවොත් නිවැරදි ද? ඒ සඳහා උත්තරය වූයේ '' ඒ ගැන මම දන්නේ නැහැ'' මෙම සාක්ෂිකරු ඉල්ලුම්කාරිය වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණියත් ආරම්භයේදීම වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණියායැයි කීම ඔහුගෙන් පැමිණිල්ලේ නියෝජිත අසන ලද ප්‍රශ්න සහ විත්තියෙන් අසන ලද හරස් ප්‍රශ්නවලට දෙන ලද පිළිතුරු මගින් පැහැදිලි වන අතර, අවුරුදු 14 ක සේවා කාලයක් සහිත සහකාර කළමණාකරු දෙන ලද සාක්ෂි පිළිගත නොහැකි වෙයි. එසේ වන්නේ උඩහමුල්ල රියදුරු අභ්‍යාස විදුහලේ විදුහල්පති ලෙස ප්‍රධාන මානව සම්පත් කළමනාකරු සේවය කරන අවස්ථාවේදී අවුරුදු 14ක සේවා කාලයක් ඇති සහකාර කළමනාකරු ලංගම සේවකයෙකු වශයෙන් ප්‍රශ්න ගත සිද්ධිය හට ගන්නා දිනය වන විට අවුරුදු 05කට පෙර සේවයට පැමිණ ඇති හෙයිනි. රජයේ නීතිඥවරිය විසින් සහකාර මානව සම්පත් කළමණාකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ දී මූලික සාක්ෂි සඳහා ඉදිරිපත් කළ සියලු ලේඛන (ඒ - 17, ඒ - 20, ඒ -21, ඒ - 29, ඒ - 30) ඔහු මීට පෙර දැක නැති බවත් අන්තර්ගතය පිළිබඳව නොදන්නා බවත් කියා සිටී. සාක්ෂිකරුගේ සාක්ෂියේ දී නැවත රැකියාව ලබා දෙන්නේ පුද්ගලික සාධාරණ හේතු මත බවත් එයට මාසයක් තුළ එම ඉල්ලීම කළ යුතු බවත් එයට බලය ඇත්තේ ප්‍රධාන මානව සම්පත් කළමණාකරුට හෝ සභාපතිවරයාට බවත්ය. ඉල්ලුම්කාර පාර්ශ්වයේ මේ නඩුව ආරම්භ වන්නේ වර්තමානයේ ප්‍රධාන මානව සම්පත් කළමණාකරු උඩහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයේ විදුහල්පති ලෙස රාජකාරි කටයුතු සිදු කළ කාලයේ දී ඉල්ලුම්කාරිය හදිසි ගිණුම් පරීක්ෂණයකට ගිය අවස්ථාවේ දී ය. ඉල්ලුම්කාරියට ගිණුම් පරීක්ෂණය

සඳහා බලය පැවරු ලේඛනය දින දෙකක් අස්ථාන ගත කිරීමත් පරීක්ෂණ මණ්ඩලයේම සිටි කලක් රියදුරු අභ්‍යාස විද්‍යාලයේ සේවය කර තිබූ බී. කාන්තිරත්න ඇති කළ හබය නිසාත් ඉල්ලුම්කාරියට පොලිසියට යාමට පවා සිදු වූ බව තහවුරු වේ. එකී හේතු මත පෙනී යන්නේ මානව සම්පත් කළමණාකරු ලාල් පිරිස් ආරක්ෂා කරමින් සහකාර මානව සම්පත් කළමණාකරු සාක්ෂි දෙන බවයි.

ලාල් පිරිස් යන අය රියදුරු අභ්‍යාස විද්‍යාලයේ විදුහල්පතිව සිටිය දී සිදු වු වංචා පිළිබඳව ඉල්ලුම්කාරිනිය නිවැරදි ගිණුම් පරීක්ෂා කිරීමේ ප්‍රතිඵලය වී ඇත්තේ නිසි කාල සීමාව තුළ ඉදිරිපත් කළ අභියාචනයට පිළිතුරක් හෝ නොදී සිටීම බව පෙනේ.

ඉල්ලුම්කාර පාර්ශ්වය වෙනුවෙන් හිටපු මානව සම්පත් කළමණාකරු ආර්. ජේ. තිලකසිරි මහතා සාක්ෂි දෙමින් ඒ - 24 ලේඛනය තමාගේ කෙටි අත්සන යොදා ලිපිකරු ආනන්ද මහතා හරහා ප්‍රධාන මානව සම්පත් කළමනාකරුට අවශ්‍ය කටයුතු කරන ලෙස සටහනක් දමා ඉදිරිපත් කරන ලද බව කියා සිටී. එසේම ඒ - 23. ඒ - 25 ලේඛන වල ද තමාගේ කෙටි අත්සන සහිත සටහනක් ඇති බව පිළිගනී. 2009 වර්ෂයේ සේවයේ සිට අයින් වු පුද්ගලයන්ගේ නම් ඇතුලත් ලේඛනයක් සකස් කර රැකියාව ලබා දුන් බව මතක බවත් කියා සිටින ලදි. විත්තියේ හරස් ප්‍රශ්න වලට පිළිතුරු දෙමින් සහකාර කළමණාකරුවන් හරහා ඉදිරිපත් කරන අභියාචනා තීරණයක් නොගෙන ප්‍රධාන මානව සම්පත් කළමණාකරුට සටහනක් තබා ඉදිරිපත් කළ පසු නැවත සටහනක් තබා ඒ සම්බන්ධව කටයුතු කරන ලෙස ඉදිරිපත් කරන අවස්ථා ඇත. එවිට සේවය අතහැර ගිය අයකුගේ අභියාචනයේ දී පූර්ව චර්යාව පවුල් දුෂ්කරතා ගැන සලකා බලන බවත් විශමාචාර සම්බන්ධව විනය පරීක්ෂණයක් පවත්වා නැවත සේවයේ පිහිටුවන බවත් ඒ - 23, ඒ - 24, ඒ - 25 ලේඛන දුටු විට අන්තර්ගතය පිළිබඳව සටහන අනුව නැවත රැකියාව ඉල්ලා ඇති බවත් සාක්ෂියේ දී කියා සිටින ලදී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් රජයේ නීතීඥවරිය හරස් ප්‍රශ්න අසමින් ඉල්ලුම්කාරියට පක්ෂපාතීව සාක්ෂි දෙන බව යෝජනා කලත් එසේ පුද්ගලික සම්බන්ධතා නැති බවත් දැනුම් දීම අනුව පැමිණි බවත් මුල් පිටපත් සඳහා තමා සටහන් තබා තිබෙන බවත් මුල් පිටපත ලංගමයේ බවත් තමා ලඟ නැති බවත් සාක්ෂි දෙන ලදි. ඉල්ලුම්කාර පාර්ශ්වයෙන් අසන ලද නැවත ප්‍රශ්න වලදී කියා සිටියේ ඒ - 23, ඒ - 24, ඒ - 25 ලේඛන පිළිබඳ තීරණ ගැනීමේ බලයක් තමන්ට නැති නිසා ලිපිකරු ආනන්ද මහතා මගින් ප්‍රධාන මානව සම්පත් කළමණාකරුට එම ලිපි ඉදිරිපත් කර ඇති බවත් එහි අන්තර්ගතය වන්නේ ''2013.04.22 දින ලිපිය මගින් සේවය අතහැර ගියා සේ සැලකීම අසාධාරණ බවට කරන ලද අභියාචනයක් බවයි.

පළමු පාර්ශ්වයේ සාක්ෂිකාරියක වන නිලංගනී රම්‍යමාලා කොළඹ ප්‍රාදේශීය කාර්යාලයේ මුදල් කළමණාකාරිය ලෙස සාක්ෂි දෙමින් 2013 මාර්තු මස සම්පූර්ණ වැටුප ලෙස (ඒ -36) දීමනා සහිතව රු.25,274.00 (රුපියල් විසි පන්දහස් දෙසීය හැත්තෑහතරයි) ක් ලියවී ඇති බවත් මුලික වැටුප රු.17,120.00 අප්‍රේල් මස වැටුප නොගෙවූ බවත් 2012 අංක 02 චක්‍රලේඛනය අනුව වැටුප් ගණනය කළ බවත් (ඒ - 37) ය. 2013.11.04 වැටුප් සංශෝධනය ( ඒ - 38 ) ක්‍රියාත්මක කර ඇති බවත් ඉන් පසු 2018. 2021/3, 2021/7, 2022/3, 2022/5 දරන චක්‍රලේඛන ක්‍රියාත්මක කර ඇති බවත් (ඒ - 39) සාක්ෂි දෙන ලදී. 2013, 2014, 2015, 2016 නිකුත් කළ චකුලේඛනය ගෙනවිත් නැකත් ඊළඟ දිනයේ රැගෙන එන බවට දන්වා සිටින ලදි. විත්තියේ නිතීඥවරිය හරස් ප්‍රශ්න අසමින් පාරිතෝශිකය ඉල්ලුම්කාරිය ලබා නොගත් බවත් 2022.08.09 සාක්ෂියේ දී කියා ඇති බැවින් ඒ පිළිබඳව කරන ලද පැහැදිලි කිරීමේ දී රු.347,400.66 ක මුදලක් ගණනය කර අංක 55501/5 දරන නඩු අංකය යටතේ මහේස්ත්‍රාත් අධිකරණයේ 2017.02.22 දින (ආර් - 20. ආර් - 31) තැන්පත් කර ඇති බව කියා සිටින ලදී.

දෙවන පාර්ශ්වය වෙනුවෙන් දෝන සන්ධ්‍යා ගර්ලි රූපසිංහ ගුණවර්ධන සාක්ෂි දෙමින් තමා විශ්‍රාමික බවත් ඉල්ලුම්කාරිය සේවයට වාර්තා නොකළ නිසා පළමුව 2013.03.18 ටෙලිග්‍රෑම් එකක් යැව්වා ඉල්ලුම්කාරිය 2013.03.13 දින දක්වා වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළා. 2013.03.14 දින සිට සේවයට පැමිණියේ නැත. මාර්තු 22 ලිපියක් මගින් දැනුම් දුන්නා සේවයට වාර්තා කරන ලෙස (ආර් - 11) ලියාපදිංචි තැපෑලෙන්. 2013.04.04 නැවත සිහිකැඳවීමක් ඇරියා ඊට පසු 2013.04.09 පළමු සිහිකැඳවීම ඇරියා. ඉල්ලුම්කාරිය සමග කිසි අමනාපයක් නොමැති බවත් මාණ්ඩලික පිළිවෙත අනුව කටයුතු කළ බවත් 2013.04.22 දින නොපැමිණිමේ හේතුව මත සේවයෙන් හා තනතුර අතහැර ගිය අයෙකු සේ කටයුතු කරන බවත් ලිපියකින් දන්වා සිටින ලද බවත් සාක්ෂි දී ඇත. ඇයගෙන් හරස් ප්‍රශ්න ඇසීමේ දී ඉල්ලුම්කාරියගේ පුද්ගලික ආරාවුල සිවිල් නීතිය අනුව නිරාකරණය කර ගත යුතු බවත් ඉල්ලුම්කාරිය හා ස්වාමිපුරුෂයා අතර ආරාවුලක් ඇති බව සාක්ෂිකාරියට සමාන්‍ය ආරංචියක් තිබූ බවත් කියා සිටින ලදී. ඉල්ලුම්කාරිය නොපැමිණීම නිසා රාජකාරී ප්‍රශ්නයක් මට ඇති වුණ බවත් ඉල්ලුම්කාරිය '' මට්ටක්කුලිය ඩිපෝවේ සේවය කරන විට දී ඇයගේ මහත්තයා ඇවිල්ලා පහර දීපු බව ඔබ දන්නවා ද?'' එයට පිළිතුර වූයේ ''මට ආරංචියක් එහෙම ආවා " ප්‍රඃ එම ඩිපෝවේ ලොග් සටහන් පිළිබඳ හා පොලිසියට ගිය බව දන්නවා ද'' උ: නැහැ ස්වාමිණි ඒක පුද්ගලික කාරණාවක්" පොලිසියට පැමිණිලි කළ බව නොදන්නා බවත්" ලිඛිතව ඒ පිළිබඳව දැනුම් දීලා නැහැ. මට මතක නැහැ 2013 වෙච්ච සිදු වීම" නමුත් අංශ ප්‍රධානියෙකු ලෙස පසුව හෝ ඒ සිද්ධිය පිළිබඳව ක්‍රියාකර නැත. (ඒ - 15) ලිපියේ කාර්යාල පිටපතේ හෝ ඉල්ලුම්කාරිය ''මෙහි පිටපතක් 2013.04.01 දින මා විසින් භාර ගතිමි" යනුවෙන් තබා ඇති සටහන පෙන්වා එහි අත්සන කාගේ දැයි (15. බී) ඇසුවිට මට මතක නැති බවත් කෙසේ වෙතත් පිටපත කාර්යාලයෙන් ලබාගෙන

තිබෙන බවට දෙන පිළිතුර '' වෙන්න ඇති" එය ලබා ගත් බවට අත්සනක් තබා ඇති බව ද පිළිගන්නා ලදී. ඒ - 16 සිට ඒ - 21 දක්වා සාක්ෂි ලේඛන අධ්‍යයනය කිරීමෙන් මා හට නිරීක්ෂණය වන්නේ සාක්ෂිකාරිය යම් කරුණු දැන දැනත් එම කරුණු සඟවා සාක්ෂි දෙන බැවින් ඇයගේ සාක්ෂිය විශ්වාසනීයත්වයෙන් තොර බවත් පිළිගැනීමට නොහැකි සාක්ෂියක් බවත් ය. අංශ ප්‍රධානී ලෙස තමා යටතේ සේවය කරන අය ගැන සොයා බැලීමෙන් හෝ අභිප්‍රේරණය සඳහා කටයුතු කර නැති බවත් බාහිර බලපෑමකින් මානුෂිකව කටයුතු කර නැති බවත් යම් බලපෑමක් මත දෙන සාක්ෂියක් බව ඇයගේ සාක්ෂියේ දී තහවුරු වෙයි. ප්‍රධානියකු ලෙස සාක්ෂිකාරිය වගකීමකින් කටයුතු කර නැති බවත් පෙනී යයි.

වීත්ති පක්ෂය වෙනුවෙන් සාක්ෂි දුන් අනුෂා චාන්දනී 2009.01.01 යතුරු ලිපිකරුවෙකු වශයෙන් මණ්ඩලයේ සේවයට බැඳී ඇත. නිවාඩු ලිපිකාරිනියක් හා අභ්‍යන්තර ගිණුම් ලිපිකාරවරියක ලෙස මණ්ඩලයේ නිවාඩු සහ චක්‍රලේඛන අනුව කටයුතු කළ බව කීවත් හරස් ප්‍රශ්න අසන විට දැක්කේ නැහැ අද ගෙනවිත් නැහැ යන පිළිතුරු දී ඇත. (19x3/29 - ඒ - 48)

(ආර් - 11 සහ ආර් - 15) ලිපියට පිළිතුරු ලිපි ලැබී තිබේ දැයි පැමිණිල්ලේ අසන හරස් ප්‍රශ්නයට ලිඛිතව පිළිතුරු දිය හැකිය යනුවෙන් ප්‍රකාශ කරන ලදි. ආර් - 1 නැමති 2013.04.21 දින අත්සන් කර ඇති ලිපිය පුද්ගලික ලිපි ගොනුවේ තිබුණි. පිටපතක් 2013.04.21 දින තැපැල් කර ඇති බව නිරීක්ෂණය වේ. පිටපත් ආයතනයේ අනෙකුත් නිලධාරීන් වෙත (ආර් - 25 ) මගින් යවා ඇත.

එච්.පී සුදර්ශක වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් සාක්ෂි දෙමින් කොළඹ ප්‍රාදේශීය කළමණාකරු බව කියා සිටී. විනය ව්‍යවස්ථාවේ 21 වගන්තිය සේවය හැර ගිය අය ක්‍රියා කළ යුත්තේ කෙසේ දැයි අන්තර්ගත බවත් 1973/29 දරන චක්‍රලේඛනය අනුව සේවය හැර ගිය අයෙකුට විශේෂ අවස්ථා වලදී නිවාඩු අවසන් වී ඇති විට පඩි රහිත නිවාඩු ලබා දෙන බවත් සේවය අතහැර ගිය අයෙකුගේ ලිපි ගොනු අවුරුදු 05 ක් තබා ගත යුතු බවත් සාක්ෂි දෙමින් කියා සිටින ලදි.

එස්. එම්. විජේමාන්න කම්කරු නිලධාරි වීත්තියේ සාක්ෂිකරු 2016 දෙසැම්බර් මස මෙම පැමිණිල්ල පළමුව කැඳවා ඇත. තමාට යොමු වීමෙන් පසු කාර්මික සම්බන්ධතා අංශයට යොමු වී ඇත.

කොළඹ ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකරු කේ. එච්. පී. ප්‍රියදර්ශන වීත්තිය වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණ කියා සිටියේ විනය ව්‍යවස්ථා සහ සේවය අතහැර යාම පිළිබඳව සාක්ෂි දීමට පැමිණි බවයි. හිමි නිවාඩු අවසන් වුව හොත් පඩි රහිත නිවාඩු විශේෂ අවස්ථා වල ලබා දෙන බව කියා සිටින ලදි. 21 වගන්තිය අනුව සේවය අවසන් කළ අයකුට මසක් ඇතුළත අභියාචනා කළ හැකි බවත් යම් ප්‍රශ්නයකට සම්බන්ධ ලිපි ලේඛන ඊට අදාළ චක්‍රලේඛනයේ 12 වන වගන්තිය හා බැඳුනු 13 වන වගන්තියේ සේවය අතහැර ගිය අයෙකුගේ ලිපි ගොනු අවුරුදු 05 ක කාලයක් සුරක්ෂිත කළ යුතු බවත් කියා සිටී. එල්. එච්. ප්‍රසන්න ප්‍රියදර්ශන උපාධිධාරි පරිවාසකයෙකු ලෙස 2000.09.28 දින සේවයට පැමිණ ඇත. කොළඹ ප්‍රධාන ප්‍රාදේශීය කළමණාකරුය. දැනට අවුරුදු 22 ක සේවා කාලයක් ඇති සාක්ෂිකරු 1973/29 අංක දරන සේවක මණ්ඩල චක්‍රලේඛනය අනුව (ආර් - 26) විශේෂ අවස්ථා වල නිවාඩු අවසන් විට පඩි රහිත නිවාඩු ලබා දෙන බවට සාක්ෂි ලබා දී ඇත. හරස් ප්‍රශ්න වලට පිළිතුරු ලබා දෙමින් සාක්ෂිකරු කියා සිටියේ සේවකයා සේවයේ නියුතු ප්‍රාදේශිකයේ අභ්‍යන්තර ගිණුම් පරීක්ෂකට විනය හා සියලු තීරණ ගැනීමේ බලය ඇති බව කියා සිටී. තම අංශයේත් ලිපි එවන සහ යවන ලේඛන නඩත්තු වන බවත් අත්‍යවශ්‍ය ලිපි ලේඛන සම්බන්ධ චක්‍රලේඛනයේ 12 වන වගන්තියේ විනය විභාගය සහ අභියාචන ලිපි ගොනු අවුරුදු 5 ක් තබා ගත යුතු යැයි සාක්ෂි දෙන ලදී.

වීත්තියේ සාක්ෂිකරු: ජී. අයි. සී.ඩී. සිල්වා 2010 සිට 2015 දක්වා විශේෂ විමර්ෂණ ඒකකයේ සහකාර කළමණාකරු ලෙස සේවය කර ඇත. සේවා කාලය තුළ වසරකට විනය පරීක්ෂණ 100 - 150 ත් අතර කර තිබෙන බවත් ඉල්ලුම්කාරිය සහ විගණක අංශයේ නිලධාරිනියක් වන බී. කාන්තිරත්න සමග ඇති වූ බහින් බස්වීමක් (ආර් - 28 ) මෙම පරීක්ෂණයේ නියෝගය දෙන විට ඉල්ලුම්කාරිය සේවය අතහැර ගොස් සිටි නිසා නියෝගය අත්හිටුවා ඇත. (ආර් 29, ආර් - 29(ඒ) ඉල්ලුම්කාරියගේ දිවුරුම් ප්‍රකාශයේ ඒ - 32) 2012.01.06 දින උඩහමුල්ල ඩිපෝවේ සිදු වූ සිද්ධිය පිළිබඳව ඉල්ලුම්කාරිය පොලිසියට පැමිණිලි කර ඇත. (ඒ - 5 ) පොලිස් වාර්තාව 2013.01.02 දින චෝදනා පත්‍රය යවා 2013.03.11 විනය පරීක්ෂණය පැවැත්වීමට නියම කර ඉල්ලුම්කාරිය නොමැතිව විනය පරීක්ෂණය පැවැත්වූ බවත් සාක්ෂිකරු සාක්ෂි දීමට පැමිණ ඇත්තේ විමර්ෂන වාර්තාව නොමැතිවය. චෝදනා පත්‍රයේ 2 සහ 3 වන කරුණු ගැන අවසන් නිගමනයට අන්තර්ගත නැති බව පිළිගනී. ඉල්ලුම්කාරිනියගේ දිවුරුම් ප්‍රකාශයේ 17 වන ඡේදය යටතේ මට්ටක්කුලිය ඩිපෝවේ විශේෂ විමර්ෂණයට ගිය අවස්ථාවේ පැමිණිලිකාරියගේ සැමියා ඩිපෝව තුළට පැමිණ පහර දී ඇති බවත් එම අවස්ථාවේ ආරක්ෂක අංශ ඔහු පිළිබඳව පොලිසියට පැමිණිලි කළ බවත් කියා සිටී. හරස් ප්‍රශ්න ඇසීමේ දී උඩහමුල්ල ඩිපෝවේ සිද්ධිය තමයි මේ ආරාවුලට තුඩු දී තිබෙන්නේ කියා ඇසූ ප්‍රශ්නයට " ඔව් " යැයි පිළිතුරු දී ඇත. එමෙන්ම රාජකාරි කාලය තුළ කාන්තිරත්න අශෝබන ලෙස කලහකාරීව හැසුරුන බව තම වාර්තාව ඇති බව ද කියා සිටින ලදී.

මෙම නඩුවේ දී දෙපාර්ශ්වයේම සාක්ෂි සහ ලේඛන පරීක්ෂා කිරීමෙන් හා විශ්ලේෂණය කළ විට පෙනී යන්නේ ඉල්ලුම්කාරිය නිවාඩු ලබා ගැනීම හෝ සේවයට වාර්තා නොකිරීමට හේතු වූ කරුණ හෙළිකර ගත යුතු බවයි. උඩහමුල්ල රියදුරු අභ්‍යාස විද්‍යාලයේ විදුහල්පති ලෙස ලාල් පිරිස් නැමති අය සේවය කරණ අවධියේ හදිසි විගණනයකට පත් කළ කණ්ඩායමට ඉල්ලුම්කාරිය ද ඇතුළත්ව සිටි අවස්ථාවේ එම කාර්යාලයේ පෙර සේවය කළ බී. කාන්තිරත්න යන තැනැත්තිය කාලයක් තිස්සේ පැවති විශමතා කිහිපයක් පිළිබඳ අවශ්‍ය පියවර ගනිමින් සිටියදී විගණනය කඩාකප්පල් කිරීමට යොදන ලද උපක්‍රමයක් වන පත්වීමේ ලිපිය දින 02 ක් අස්ථාන ගත කර තිබීම හා ඉල්ලුම්කාරිය සමඟ ආරාවුලක් ඇති කර ගැනීම පෙන්වා දිය හැක. එදින පොලිසියට ඉල්ලුම්කාරිය 2012.01.06 දී පැමිණිලි කළ බවටත් 2012.01.30 දින පොලිස් පරීක්ෂණයට පෙනී සිටීම නිසා රාජකාරි නිවාඩු අනුමත නොකළ බවත් (ඒ - 5 ) තහවුරු වෙයි. ඉල්ලුම්කාරියගේ තනතුරට අදාළ වැටුප ලබා නොදී ප්‍රමාද කිරීම ( ඒ - 6 ලිපිය) උසස් වීම් ලබා ගැනීමට තිබූ අවස්ථාවට (vi ශ්‍රේණිය) හිතාමතා ලාල් පීරිස් යන අය  අවහිර කළ බව දිවුරුම් සාක්ෂි දී ඇත. ප්‍රධාන මානව සම්පත් කළමනාකර සාක්ෂියට කැඳවනු ලැබූවත් සහකාර කළමණාකරු විභාගයට සාක්ෂි දීමට එවා තිබුණි. ඔහු අදාළ ලේඛන රැගෙන විත් තිබුණේ ද නැත. උඩහමුල්ල විදුහල්පති ප්‍රධාන මානව සම්පත් කළමනාකරු ලෙස පත් වූ පසු දිගින් දිගටම ඉල්ලුම්කාරිය පළිගැනීමට ලක් කර ඇති බව පෙනී යයි. ඔහුගේ නිල බලය යොදා ඉල්ලුම්කාරිය සේවය කළ අංශයේ ප්‍රධානි ද්වේශ සහගත ලෙස සේවයෙන් ඉවත්ව යෑමට සලසා ඇති බව නිවාඩු ගැන දෙන ලද සාක්ෂි හා සටහන් අනුව පැහැදිලිය. උදාහරණයක් වශයෙන් සමහර අවස්ථා වල මුල් ලිපිය ගොනුවේ තබා ගෙන පිටපත ඉල්ලුම්කාරියට යැව්වා යැයි සාක්ෂිකාරියක සාක්ෂි දී ඇත.

ඉල්ලුම්කාරියගේ පවුලේ ප්‍රශ්න උග්‍රවන ලෙස කටයුතු කළ බව පැහැදිලි වෙයි. සමහර විට ආයුධ සමඟ කාර්යාලයට පැමිණි බව විත්තියේ පළමු සාක්ෂිකාරිය වන දෝන සධ්‍යශීලී රූපසිංහ වන අංශ ප්‍රධානිගේ සාක්ෂිය තහවුරු කරයි. ඇය කිසිම වගකීමකින් කටයුතු නොකළ බව ඇයගේ සාක්ෂිවලින් තහවුරු වෙයි.

විත්තිය වෙනුවෙන් සාක්ෂි දීමට පැමිණි අය ඉල්ලුම්කාරියට වාසිවේ යැයි සිතා ලේඛන කිසිවක් ගෙනවිත් නොතිබිණි. පසුව ඒවා ඡායා පිටපත් ලබා දෙන ලෙස දන්වමින් පසු හරස් ප්‍රශ්න වලට අවස්ථාව උදාකර දුන්නත් විභාගයේ දී දිගින් දිගටම දින යෑම සිදු වීම කණගාටුදායකය.

2013.04.22 දින (ඒ - 20) ලේඛන ගත තැපෑලෙන් යවා ඉල්ලුම්කාරිය යවන ලද අභියාචනා ලිපිය ලිපි යැවීමේ ලේඛනයක් ඉදිරිපත් කරන ලෙස දැන්වුවත් එවැනි ලේඛනයක් නැතැයි සාක්ෂි දී ඇත. ඉහළ කළමනාකාරිත්වයට පිටපත් සහිතව අංශ ප්‍රධානිට යවා ඇති (ඒ- 19) ලිපි වලට පිළිතුරු දී නැත. ඉල්ලුම්කාරිය තම ජීවිත තර්ජන නොතකා සේවයට වාර්තා කළ දිනයේ අංශ ප්‍රධානී සන්ධ්‍යා ගුණවර්ධන මිය සේවයට වාර්ති කිරීමට ඉඩ නොදී ප්‍රධාන කාර්යාලයට යැවීමත් එම ස්ථානයේ ප්‍රධාන තැනැත්තිය ක්‍රියා කළ ආකාරය අනුව පසුව පිටකොටුව පොලීසියට පැමිණිලි කර ඇත. සහකාර මානව සම්පත් කළමනාකරුවන්, නිවාඩු පිළිබඳව ක්‍රියාකරන විගණන නිලධාරීන් ඔවුන්ගේ රාජකාරියට අදාළ චක්‍රලේඛන අභ්‍යන්තර නියෝග, ව්‍යවස්ථා විනය රෙගුලාසි දැක නැති හෝ නොදන්න බව ප්‍රකාශ කිරීම තම රාජකාරියට තනතුරට නොහොබිනා අපහාස වන ආකාරයේ සාක්ෂි දීම පුදුම සහගතය. සමහර චක්‍රලේඛන සොයා ගැනීමට නැති බවත් තිබේ නම් ඉදිරිපත් කරන්නම් යනුවෙන් සාක්ෂි දීම හාස්‍ය ජනකය. ඒ - 40, ඒ- 48 වැනි සේවක මණ්ඩල කොට්ඨාස චක්‍රලේඛ මගින් දී ඇති උපදෙස් දැන දැනත් ඒවා උල්ලංඝනය කරමින් ඉල්ලුම්කාරියට සේවයට වාර්තා කිරීමට ඇති අපහසුතා දන්වද්දී හා වෙනත් සේවා ස්ථානයක් ලබා දෙන ලෙස ඉල්ලද්දී වැටුප් රහිත නිවාඩු ලබා දීමට හැකියාව තිබියදී සේවය හැර ගියා  යැයි සලකා කටයුතු කිරීම අයුක්ති සහගත හා අසාධාරණ ක්‍රියාවක් බව පෙනේ. යම් අයෙකුට සේවය කරන ස්ථානයට පැමිණ තර්ජනය කරයි නම් පුද්ගලික ප්‍රශ්නයක් වුවත් සේවා ස්ථානයේදී ආරක්ෂාව සැපයීමට වගඋත්තරකාර පාර්ශ්වය බැඳී සිටියත් එවැනි ක්‍රියා මාර්ග නොගෙන ආයුධ ගෙන කාර්යාලය තුළට තර්ජනකරුවන් පැමිණ ඇති බව දුරකථන මගින් දැනුම් දී නොපැමිණෙන ලෙස දැන්වීම ලැජ්ජා සහගත හා වගකීම් පැහැර හැර ඇති බව මනාවට පැහැදිලි ය. එසේ කරණුයේ ඉහළින් ලැබෙන නියෝග අනුව ක්‍රියා නොකළ හොත් තමන්ටත් අපහසුතා ඇති වේ යැයි යන හැඟීම නිසා ඉල්ලුම්කාරියට විවිධ හිරිහැර වලට ලක්වීමට ඉඩ හැරීමෙන් සේවය අතහැර යාමට සැලැස්වීම සඳහාය. ඉල්ලුම්කාරිය ඉදිරිපත් කළ අභියාචනා හා එම අභියාචනයක් පිළිබඳ කළ සිහිපත් කිරීම් නොසලකා හැරීමෙන් ද තම අමාත්‍යාංශය මගින් පැමිණිලිකාරියගේ ගැටලුව ගැන විමසා ඉහළ කළමනාකාරිත්වයට එවූ ලිපියට පවා පිළිතුරු නොදීමෙන් ද අවසානයේ තමාට වූ අසාධාරණය පිළිබඳව දන්වා සිටීම වැරදි යැයි කාලය ඉකුත් වී ඇතැයි වගඋත්තරකරු නඩු විභාග යේ දී තර්ක කිරීමට උත්සහ කරන ලදි. පිටපත් සහිත ලිපියක මුල් ලිපිය යවන්නාට යැවිය යුතු වුවත් ලංගම වැනි සංවිධායක මුල් පිටපත ගොනුවේ ගොනු කිරීම ප්‍රතිපත්තිය යැයි සාක්ෂි දීම ආයතනයට ද නින්දා සහගතය. මෙවැනි ක්‍රියා නිසා මෙම ඉල්ලුම්කාරිය සේවයෙන් ඉවත් කිරීමට  ද උඩ සිට පහළට යෙදූ දිගු කාලීනව කළ කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් බවත් එය ද්වේශ සහගතව පළිගැනීමට ලක් කිරීමක් බවත් වැඩිදුරටත් තහවුරු වෙයි.

මූලික පැමිණිල්ලේ ඉල්ලුම්කාරිය නැවත සේවය අපේක්ෂා කළ ද වගඋත්තරකරු ඊට එකඟ නොවූ බැවින් ඉල්ලුම්කාරිය සේවය කළේ නම් 2013 අප්‍රේල් මස සිට නඩු විභාගය අවසන් වූ 2023.03.07 දින දක්වා ලැබිය යුතු වැටුප ගණනය කර එක්ස් - 01 ලෙස සලකුණු කර ඉල්ලුම්කාරිය විසින් නඩුවට ගොනු කර ඇත.

ගමනා ගමන මණ්ඩලයට කර ඇති අනිසි වැය බර නිසා මෙම වන්දිය ඉහළ කළමනාකාරිත්වයෙන් අය කර ගැනීම යුක්ති සහගත වන අතර රාජ්‍ය හෝ රජයට අනුබද්ධ ආයතන වල ඉහළ නිලධාරීන් තම නිලයට නුසුදුසු නෛතික නොවන අත්තනෝමතික තීරණ ගැනීම නිසා එම ආයතන වලට සිදුවන පාඩුව හෝ අලාභය ගැන එම නිලධාරීන්ගෙන් පෞද්ගලිකව අය කර ගැනීමට නෛතික ප්‍රතිපාදන නොමැති වීම බරපතල අඩුපාඩුවක් වන බැවින් එක් එක් ආයතන මගින් හෝ අමාත්‍ය මණ්ඩලය මගින් හෝ මෙවැනි දේ වලක්වා ගැනීම සඳහා නෛතික ප්‍රතිපාදන පිළියෙල කළ යුතු යැයි මා යෝජනා කරමි.

ඉහත සඳහන් සාක්ෂි සටහන් හා සලකුණු කරන ලද ලේඛන අනුව දෙනු ලබන මෙම නියෝගය *ගැසට් නිවේදනයේ* පළ වී ලිත් මසක් තුළ ඉල්ලුම්කාරිය ඉල්ලා ඇති අදාළ මුදල වන රු. 4,050,862.00 (හතලිස් ලක්ෂ පනස්දහස් අටසිය හැට දෙක) ක මුදල නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙස මෙයින් නියම කර සිටිමි.

මෙම සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකශ කරමි.

ආර්. එස්. ආරියප්පෙරුම
බේරුම්කරු.

2024 මැයි මස 30 වැනි දින දී ය.

EOG 07 – 0229